# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2265/34 – 2022 පෙබරවාරි 02 වැනි බදාදා – 2022.02.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/24.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2021.05.06 වැනි දින අංක 2226/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.05.03 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ටී. ඒ. දමිත් නිස්සංක මයා, 58/15, කේ. ජේ. ද සිල්වා මාවත, මහා වීදිය, මොරටුව.
2. යූ. ඩී. හර්ෂණ අබේරත්න මයා, 14/ඩී, ගැමුණු පාර, පළවන පටුමග, කොතලාවල, කඩුවෙල.
3. එස්. ඒ. තිලංග සුදර්ශන මයා, 91/බී, කලායතන පාර, හිරණ, පානදුර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 11-2/1, රොඩ්නි වීදිය, කොළඹ 08.

1A – G 35983 – 15 (2022/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අතර පවත්නා 2021.04.30 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පියසේන ජී. පුස්සාවල මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2021.05.03 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2022 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

EOG 01 - 0369/1

---

මගේ අංකය: IR/COM/04/2020/24.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ටී. ඒ. දමිත් නිස්සංක මයා, 58/15, කේ. ජේ. ද සිල්වා මාවත, මහා වීදිය, මොරටුව.
2. යූ. ඩී. හර්ෂණ අබේරත්න මයා, 14/ඩී, ගැමුණු පාර, පළවන පටුමග, කොතලාවල, කඩුවෙල.
3. එස්. ඒ. තිලංග සුදර්ශන මයා, 91/බී, කලායතන පාර, හිරණ, පානදුර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 11-2/1, රොඩ්නි වීදිය, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බදුල්ල, වෙලේකඩේ, නව වෙළඳ සංකීර්ණය, අංක 62 ඒ, නීතිඥ ජනරංජනී සුමිත් අමරසිරි මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2022 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2020/24.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ටී. ඒ. දමිත් නිස්සංක මයා, 58/15, කේ. ජේ. ද සිල්වා මාවත, මහා වීදිය, මොරටුව.

2. යූ. ඩී. හර්ෂණ අබේරත්න මයා, 14/ඩී, ගැමුණු පාර, පළවන පටුමග, කොතලාවල, කඩුවෙල.

3. එස්. ඒ. තිලංග සුදර්ශන මයා, 91/බී, කලායතන පාර, හිරණ, පානදුර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 11-2/1, රොඩ්නි වීදිය, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික** ආරාවුලට **හේතු වී පවත්නා කරුණු** වනුයේ,

''එස්. එෆ්. ලොජිස්ටික්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කර ඇති ටී. ඒ. දමිත් නිස්සංක, යූ. ඩී. හර්ෂණ අබේරත්න හා එස්. ඒ. තිලංග සුදර්ශන යන සේවකයින්ට ගෙවමින් තිබූ වාහන දීමනාව සහ ඉන්ධන දීමනාව 2018 සැප්තැම්බර් මස සිට නොගෙවීමෙන් එම සේවකයින්ට අසාධාරණයක් සිදුව තිබේ ද? සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජනවාරි මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01 - 0369/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.